## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2012

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2012

පර්යේෂණ හා සංවර්ධන ශාබාව,
ජාතික ඇගයීම් හා පරික්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2012

**විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය :**

අතීතයේදී ශ්‍රී ලංකාවේ විභාග පැවැත්වීම අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කරන ලද ප්‍රසිද්ධ විභාග මණ්ඩලයක් මගින් සිදු කෙරිණි. 1949 වර්ෂයේ දී එම කාර්යය අධ්‍යාපන අමාත්‍යාංශයේ පිහිටුවන ලද විභාග ශාඛාවට පැවරුණු අතර එමගින් එම වර්ෂයේදී විභාග 78 ක් පවත්වා ඇත. 1951 ඔක්තෝබර් මස 01 වන දින එම ශාඛාව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවක් බවට පත්වූ අතර එතැන් පටන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නමින් ප්‍රසිද්ධ විය.

1968 අංක 25 දරන පනතින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ප්‍රසිද්ධ විභාග පැවැත්වීම පිළිබඳ ව නෛතික බලතල ඇති එකම ආයතනය බවට පත් විය. එදා සිට මේ දක්වා විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් පුළුල් වී ඇත. දැනට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් වර්ෂයකට විභාග 300ක් පමණ සංවිධානය කර පවත්වනු ලැබේ.

අද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව (National Evaluation & Testing Service) NETS වශයෙන් පාසල් විභාග සම්බන්ධ ආයතන හා නියෝජිත ආයතන (Agency Functions) ලෙස අංශ දෙකකින් ක්‍රියාත්මක වේ.

මෙම ආයතන දෙකට ම අයත් කාර්යයන් ප්‍රධාන වශයෙන් අංශ තුනකින් ක්‍රියාත්මක වේ.

1. පාසල් විභාග හා සම්බන්ධ සේවා
2. නියෝජිත ආයතන සේවා (Agency Functions)
3. පොදු සේවා (Common Functions)

**01. පාසල් විභාග හා සම්බන්ධ සේවාවලට අයත් ශාඛා**

1.1. පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
1.2 රහස්‍ය ශාඛාව
1.3 ඇගයීම් ශාඛාව
1.4 විමර්ශන ශාඛාව
1.5 සහතික පත්‍ර ශාඛාව
1.6 පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

**02. නියෝජිත ආයතන** (Agency Functions) **විභාග හා සම්බන්ධ සේවාවලට අයත් ශාඛා**

2.1 සංවිධාන හා විදේශ විභාග ශාඛාව
2.2 රහස්‍ය ශාඛාව
2.3 ඇගයීම් ශාඛාව
2.4 ප්‍රතිඵල ශාඛාව

**03. පොදු සේවා** (Common functions) **සම්බන්ධ ශාඛා**

3.1 ආයතන ශාඛාව
3.2 තැපැල් ශාඛාව
3.3 ගිණුම් ශාඛාව
3.4 මුද්‍රණාලය
3.5 පරිගණක ශාඛාව
3.6 දත්ත සටහන් ශාඛාව
3.7 සැලසුම් හා නියාමන ශාඛාව

## 01. පාසල් විභාග හා සම්බන්ධ සේවා කටයුතු

### 1.1 පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව

පාසල් විභාග සඳහා වෙන් වූ මෙම ශාඛාවේ වාර්ෂික වැඩ සැලැස්මට අනුව 2012.01.01 සිට 2012.12.31 දක්වා සංවිධානය කොට පවත්වන ලද පාසල් විභාග හා පාසල් පද්ධතියේ වෙනත් විභාග පිළිබඳ දත්ත පහත දැක්වේ.

| විභාගය | මධ්‍යස්ථාන සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | විභාගය පැවති කාල සීමාව | ප්‍රතිඵල නිකුත් කළ දිනය | විභාග පරිපාලන කාර්යය සඳහා සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| අ.පො.ස (උ.පෙළ) විභාගය නව නිර්දේශය - 2012 | 1,746 | 235,774 | 2012.08.06 2012.08.30 | 2013.01.31 | 4,070 |
| අ.පො.ස (උ.පෙළ) විභාගය පැරණි නිර්දේශය - 2012 | 347 | 41,323 | 2012.08.06 2012.08.30 | 2013.01.31 | 902 |
| අ.පො.ස (සා.පෙළ) විභාගය - 2012 | 4048 | 542,260 | 2012.12.11 2012.12.20 | - | 9170 |
| සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2012 | 1,153 | 148,376 | 2012.10.21 | - | 2,796 |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2012 | 2803 | 318,416 | 2012.08.26 | 2012.09.24 | 6,618 |
| උපාධිධාරී නොවන ගුරුවරුන් සඳහා වන විභාගය - 2011(2012) | 51 | 6,436 | 2012.09.20 2012.09.24 | - | 663 |
| ගුරු විද්‍යාල අවසාන විභාගය - 2012 | 10 | 945 | 2012.09.20 2012.09.24 | - | 130 |
| ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා බාහිර අවසාන පරීක්ෂණය - 2011(2012) | 25 | 3449 | 2012.02.27 2012.03.05 | 2012.08.09 | 295 |
| ජාතික ශික්ෂණ විද්‍යාපීඨවල ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ පාඨමාලාවලට තෝරා ගැනීමේ පරීක්ෂණය - 2011(2012) | - | - | - | - | - |
| පිරිවෙන් ගුරු අවසාන විභාගය | - | - | - | - | - |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ විභාගය - 2012 | 07 | 902 | 2012.01.21 | 2012.06.06 | 76 |
| එකතුව | 10,190 | 1,297,881 | | | 24,720 |

මූලාශ්‍රය - පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව

## 1.2 රහස්‍ය ශාඛාව (පාසල් විභාග)

2012 වර්ෂය තුළ දී මෙම ශාඛාව මගින් පහත සඳහන් විභාගවලට අදාළ ව මෙම ශාඛාවට අයත් සියලු ම කාර්යයන් (පරීක්ෂක මණ්ඩල පත් කිරීමේ සිට, සම්බන්ධීකරණ නිලධාරීන්/විභාග ශාලාධිපතිවරුන් වෙත ප්‍රශ්න පත්‍ර ලබාදීම හා අදාළ අවස්ථාවලදී උත්තර පත්‍ර, ඉතිරි ප්‍රශ්න පත්‍ර හා ලිපි ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවට ආපසු ලබාගැනීම තෙක්) ඉටුකර ඇත.

01. අ.පො.ස. උසස් පෙළ විභාගය - නව නිර්දේශය

02. අ.පො.ස. උසස් පෙළ විභාගය - පැරණි නිර්දේශය

03. 5 වසර ශිෂ්‍යත්ව විභාගය

04. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය

05. ගුරු විද්‍යාල අවසාන (නව සහ පැරණි) විභාගය

06. උපාධිධාරීන් නොවන නුපුහුණු ගුරුවරුන් සඳහා පුහුණු පාඨමාලාවේ අවසන් විභාගය

07. සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (GIT) විභාගය

මූලාශ්‍රය - රහස්‍ය ශාඛාව (පාසල් විභාග)

### 1.3 ඇගයීම් ශාඛාව (පාසල් විභාග)

සියලු ම විභාගවල උත්තර පත්‍ර නිවැරදි ව හා සංගතතාව ආරක්ෂාවන පරිදි ඇගයීමට ලක් කිරීම මෙම ශාඛාවේ ප්‍රධානතම කාර්යයයි. ඉලක්ක කර ගත් දිනට කාර්යක්ෂමවත්, නිවැරදිවත්, ඇගයීම් කටයුතු කිරීමෙහිලා පරීක්ෂකවරුන් දැනුවත් කිරීම හා ඇගයීම් කටයුතු නිම කිරීම මෙම ශාඛාවෙන් ඉටු කෙරේ.

2012 වර්ෂයේ පවත්වන ලද විභාගවල ඇගයීම් කටයුතු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | විභාගය | ඇගයීම් මණ්ඩල ගණන | | | ඇගයීම් කටයුතු සිදුකළ කාලය | ඇගයීම් සඳහා සහභාගි වූ පරීක්ෂකවරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | | |
| 2011 | අ.පො.ස. (සා.පෙළ) විභාගය | | | | 2011.12.29 - 2012.01.07 | 27,870 |
| | I අදියර | 1,017 | 374 | 287 | | |
| 2011 | අ.පො.ස. (සා.පෙළ) විභාගය | 105 | 63 | 12 | 2012.01.21 - 2012.01.29 | |
| | II අදියර | - | - | - | | |
| | කේවල<br>කේවල නොවන | - | - | - | | |
| 2012 | ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා අවසාන විභාගය | 17 | - | 20 | 2012.04.21 - 2012.04.29 | 592 |
| | ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා බඳවා ගැනීමේ විභාගය | 06 | - | 10 | 2012.11.21 - 2012.12.18 | 256 |
| 2012 | අ.පො.ස. (උ.පෙළ) විභාගය | | | | 2012.10.07 - 2012.10.18 | |
| | I අදියර (පැරණි නිර්දේශය) | 22 | 10 | 20 | | 780 |
| | I අදියර (නව නිර්දේශය) | 187 | 44 | 97 | | 4,920 |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගය | | | | 2012.10.25 - 2012.11.05 | |
| | II අදියර (පැරණි නිර්දේශය) | 89 | 22 | 29 | | 7,260 |
| | II අදියර (නව නිර්දේශය) | 191 | 90 | 63 | | |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගය | | | | 2012.11.12 - 2012.11.21 | |
| | III අදියර | 93 | 38 | 32 | | 2,445 |
| | කේවල<br>කේවල නොවන | -<br>- | -<br>- | -<br>- | 2012.10.25 - 2012.11.30 | 210 |
| 2012 | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය | 234 | 78 | - | 2012.08.30 - 2012.09.09 | 4,680 |
| 2011 | අ.පො.ස. (සා.පෙළ) විභාගය | | | | 2012.06.02 - 2012.07.10 | 950 |
| | | අයදුම්කරුවන් ගණන | | | | |
| | නැවත සමීක්ෂණය | 47,915 | 11,320 | 21,790 | | |
| 2011 | අ.පො.ස. (උ.පෙළ) විභාගය | | | | | |
| | නැවත සමීක්ෂණය | 144,000 | | | 2012.02.05 - 2012.04.10 | 1,660 |
| 2011/ 2012 | ගුරු විද්‍යාල අවසාන විභාගය | | | | | |
| | II වසර | | | | ඇගයීම් කටයුතු 2012 වසරේ සිදුකර නැත | |
| | කේවල | | | | | |

මූලාශ්‍රය - ඇගයීම් ශාඛාව (පාසල් විභාග)

### 1.4 විමර්ශන ශාඛාව

කිසිදු භේදයකින් තොර ව විභාගාපේක්ෂකයිනට සාධාරණත්වය ඉටු වන අයුරින් විභාග පැවැත්වීම විභාග දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය මෙන්ම වගකීම වේ. විභාග නීති රීති උල්ලංඝනය වන පරිදි අපේක්ෂකයන් වංචනික ක්‍රියාවල නිරතවීම සහ විභාග කාර්ය මණ්ඩල විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා විමර්ශනයට ලක් කොට අදාළ නීතිමය පියවර ගැනීම මෙම ශාඛාවේ ප්‍රධාන වගකීම වේ. විභාග වංචා/අක්‍රමිකතා වාර්තා ලබා ගැනීම හා ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ කටයුතු කාර්යක්ෂම කිරීම මේ අංශය මගින් සිදු කෙරේ.

| **විභාගය** | **වාර්තා වූ වංචනික ක්‍රියා සංඛ්‍යාව** | **දඬුවම් දුන් සංඛ්‍යාව** | **ප්‍රතිඵල නිදහස් කළ සංඛ්‍යාව** | **විමර්ශන අවසන් නොවූ සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| 1. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය -2012 | 32 | - | 32 | - |
| 2. අ.පො.ස. (සා.පෙළ) විභාගය 2011 | 7978 | 112 | 7824 | 42 |
| 3. අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2012 | 3560 | 48 | 3471 | 41 |
| **ආයතනික විභාග** | **4875** | **420** | **4391** | **64** |

අධිකරණයේ පරිපාලන කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් නඩු පැවරෙන විෂයයන් සඳහා ගොනු විවෘත කිරීම හා, පිළිතුරු වාර්තා හා අවශ්‍ය පරිදි උපලේඛන නීතිපති මඟින් අධිකරණයට යොමු කිරීම, නීතිපතිගෙන් ලිඛිතව සහ වාචික උපදෙස් ලබා ගැනීම හා අධිකරණයෙන් කරනු ලබන දැනුම් දීම මත අදාළ දිනවල දී නිලධාරීන් අධිකරණයේ පෙනී සිටීම යනාදී සියලු කටයුතු සිදු කර ඇත.

මූලාශ්‍රය - විමර්ශන ශාඛාව

## 1.5 සහතික පත්‍ර ශාඛාව

මෙම ශාඛාවට පැවරී ඇති වගකීම් හා කාර්ය භාරය පහත සඳහන් වේ.

1. පහත සඳහන් විභාග සහතික නිකුත් කිරීම
   - i පුහුණු ගුරු සහතික
   - ii ප්‍රින්සෙට් ගුරු පුහුණු සහතික
   - iii දහම් පාසල් අවසාන සහතික
   - iv බෞද්ධ ධර්මාචාර්ය සහතික
   - v අල් අලීම් සහතික
   - vi විවිධ කාර්මික විභාග සහතික
   - vii ඉංග්‍රීසි කථන සහතික
   - viii ජාතික නැටුම්/සංගීත සහතික
   - ix බටහිර සංගීත සහතික
   - x වාණිජ විද්‍යා සහතික
   - xi පිරිවෙන් අවසාන සහතික

2. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, කොමිෂන් සභා, සමුපකාර සමිති හා පෞද්ගලික අංශයේ සේවකයින්ගේ අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ), ගුරු විද්‍යාල අවසාන, කාර්මික විද්‍යාල, ජාතික නැටුම් හා සංගීත ආදී විවිධ සහතික සනාථ කිරීම
3. ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා මත දේශීය විභාග සඳහා ප්‍රතිඵල ලේඛන සහ විදේශ විශ්ව විද්‍යාල ඇතුළු ආයතන සඳහා සහතිකවල දෙවන පිටපත් නිකුත් කිරීම
4. විභාග ප්‍රතිඵල ලේඛන ආරක්ෂා සහිත ව තබා ගැනීම
5. ප්‍රතිඵල ලේඛනවල වැරදි නිවැරදි කිරීම
6. සහතික පත්‍රවල හෝ ප්‍රතිඵල සටහන්වල සිදු වන වංචනික ක්‍රියා සම්බන්ධයෙන් කටයුතු කිරීම

2012.01.01 දින සිට 2012.12.31 දින දක්වා ඉටු කරන ලද කාර්යයන් 7 පිටුවේ දැක්වේ.

| | වැඩ විස්තරය | ඒකකයක වටිනාකම රුපියල් | ඒකක ප්‍රමාණය | ආදායම රුපියල් |
|---|---|---|---|---|
| 01 | එක් දින සේවය මගින් විදේශ සහතික නිකුත් කිරීම | 500.00 | 39,366 | 19,683,000.00 |
| | - එම පිටපත් - | 200.00 | 12,400 | 2,480,000.00 |
| | - විභාග අංක සෙවීම - | 100.00 | 3,259 | 325,900.00 |
| 02 | සාමාන්‍ය විදේශ සහතික නිකුත් කිරීම | 250.00 | 1,567 | 391,750.00 |
| | - එම පිටපත් - | 150.00 | 212 | 31,800.00 |
| | - විභාග අංක සෙවීම - | 100.00 | 67 | 6,700.00 |
| 03 | තැපැල් කිරීම | 250.00 | 150 | 37,500.00 |
| 04 | දේශීය දෙවන පිටපත් | 100.00 | 522 | 52,200.00 |
| 05 | විභාග ප්‍රතිඵල සනාථ කිරීම<br><br>(රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස්, හමුදා, සෞඛ්‍ය, අධ්‍යාපන, අමාත්‍යංශවලට අයත්, සියලුම ආයතනවල) | | 68,263 | රජයේ ආයතන සඳහා මුදල් අය කිරීමක් නොමැත. |
| | බැංකු, සංස්ථා, මණ්ඩල, අධිකාරි හා පෞද්ගලික ආයතනවල සනාථ කිරීම් හා දඩ මුදල් අය කිරීම වෙනුවෙන් ලැබී ඇති මුදල | | 7023 | 702,300.00 |
| 06 | ගුරු විද්‍යාල සහතික - සිංහල | | 223 | මුදල් අය කිරීමක් නොමැත. |
| | - දෙමළ | | 424 | |
| 07 | අල් අලීම් සහතික | | 621 | |
| 08 | "ප්‍රින්සෙට්" සහතික | | 407 | |
| 09 | කාර්මික විද්‍යාල සහතික | | 36 | |
| 10 | මුලික පිරිවෙන් සහතික (දෙවන පිටපත) | | 242 | |
| 11 | බෞද්ධ ධර්මාචාර්ය සහතික | | 1736 | |
| 12 | ජාතික නැටුම්/සංගීත සහතික | | 100 | |
| 13 | අපරදිග සංගීත සහතික | | 60 | |

මූලාශ්‍රය - සහතික පත්‍ර ශාඛාව

## 1.6 පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන පාසල් විභාග හා සම්බන්ධ සියලු ම විභාගවල ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දත්ත එක්රැස් කිරීම, ප්‍රශ්න පත්‍ර හා ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම හා ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ හා පිළිතුරු පත්‍ර ඇගයීමේ කාර්යයන්හි යෙදෙන අය ඒ පිළිබඳව දැනුවත් කිරීම මෙම ශාඛාවේ ප්‍රධාන කාර්යයකි. එමෙන්ම පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලියට අදාළ අවසාන ලකුණු පාසල්වලින් ගෙන්වා ගැනීමත් මෙම ශාඛාව මගින් සිදු කෙරේ. තවද ප්‍රශ්න පත්‍ර විශ්ලේෂණය තුළින් ලබාගන්නා තොරතුරු ඇසුරින් අයදුම්කරුවන් පහළ සාධන මට්ටමක් දක්වන විෂය ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම මෙම ශාඛාව මගින් කෙරෙන වැදගත් කාර්යයකි.

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් 2012 වසරේ දී සිදුකරන ලද කාර්යයන් පහත දැක්වේ.**

01. අ.පො.ස. (සා.පෙළ) - 2011 විභාග ප්‍රතිඵල හා ප්‍රශ්න පත්‍ර විශ්ලේෂණය කර එම තොරතුරු අදාළ සියලුම පාර්ශ්වයන් වෙත ලබාදී ඒ පිළිබඳව ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් පවත්වා දැනුවත් කර ඇත. එහිදී සිසුන් දුර්වලතා දක්වන විෂය ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ පිළිබඳව දැනුවත් කරන ලදි. ඊට අදාළ වාර්තාව කැබිනට් මණ්ඩලය වෙත ද ඉදිරිපත් කරන ලදි.

02. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2012 ට අදාළව ප්‍රශ්න පත්‍ර විශ්ලේෂණය කර සිසුන් දුර්වලතා දක්වන විෂය ක්ෂේත්‍ර හඳුනාගෙන වාර්තාවක් සකස් කර ඇත.

03. අ.පො.ස. (සා.පෙළ) - 2011, අ.පො.ස. (උ.පෙළ) - 2011 හා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2011 ට අදාළ පාසල් සාධන දර්ශක සකස් කර ඒ පිළිබඳ ව සියලුම අධ්‍යාපන බලධාරීන් දැනුවත් කර ඇත. මේ තුළින් සෑම පාසලකම සාධන මට්ටම පිළිබඳ තොරතුරු දැකගත හැකිය.

04. ඇගයීම් වාර්තා සකස් කිරීම :
අ.පො.ස. (සා.පෙළ) - 2010 ට අදාළ විෂයන් 11ක් සඳහා, ඇගයීම් වාර්තා සකස් කර පාසල්වලට බෙදා හැර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ද ඇතුළත් කර ඇත. අදාළ විෂයන්හි ප්‍රශ්න පත්‍රවලට සිසුන් පිළිතුරු සපයා ඇති ආකාරය විශ්ලේෂණය කර ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය සහ ප්‍රශ්න කොටස්/ අනු කොටස් අනුව පහසුතා දර්ශක ද ගණනය කර දක්වා ඇත. සෑම ප්‍රශ්නයකටම අදාළ පිළිතුරු හා පිළිතුරු සැපයීමේදී අයදුම්කරුවන් දැක්වූ දුර්වලතා සහ ඒවාට විසඳුම් ද ඉදිරිපත් කර ඇත. එමෙන්ම අ.පො.ස. (සා.පෙළ) - 2011 ට අදාළව විෂයන් 11 ක් සඳහා ඇගයීම් වාර්තා සකස් කර මුද්‍රණය සඳහා සූදානම් කර ඇති අතර, අ.පො.ස. (උ.පෙළ) - 2011 ට අදාළව විෂයයන් 11 ක් සඳහා ඇගයීම් වාර්තා ද සකස් කර ඇත.

05. ප්‍රථම වතාවට අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) භාවිත කර අ.පො.ස. (උ.පෙළ) - 2011 විභාගයේ ප්‍රශ්න පත්‍ර විශ්ලේෂණය කර ප්‍රධාන පාලක පරීක්ෂකවරුන් සඳහා වර්තාවක් ලබාදී ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කර ඇත.

06. අ.පො.ස. (සා.පෙළ) - 2012 විභාගයට අදාළ උපකාරක සම්මන්ත්‍රණය සඳහා ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු සකස් කර පාසල්වලට යැවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට බාර දෙන ලදී.

07. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ සියලුම විභාගවල ප්‍රතිඵල විශ්ලේෂණ ඇතුළත් සංඛ්‍යා ලේඛන අත්පොත් 02ක් (2005 - 2007 සහ 2008 - 2010 සඳහා) සකස් කර සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු විද්‍යාලවලට බෙදා හැර ඇත.

08. පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල පිළිබඳව දැනුවත් කිරීම සඳහා ද්විතියික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (SEMP) ආධාර මත සැලසිනේ ආයතනය මගින් "අකුරු තරහ නෑ" ටෙලි නාට්‍යය නිෂ්පාදනය කර විකාශනය කරන ලදී.

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

## 02. නියෝජිත ආයතන සේවා කටයුතු (Agency Functions)

### 2.1 සංවිධාන හා විදේශ විභාග ශාඛාව

පාසල් විභාග හැර විදේශ විභාග හා දේශීය වෙනත් විභාග සංවිධානය කිරීම හා පැවැත්වීම පිළිබඳ කාර්යයන් මෙම ශාඛාව මගින් සිදු කෙරේ.

2012.01.01 සිට 2012.12.31 තුළ වාර්ෂික වැඩ සැලැස්මට අනුව ඉටුකර ඇති කාර්යයන් පහත සඳහන් වේ.

| පවත්වන ලද විභාග වර්ගය | පවත්වන ලද විභාග සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | ආදායම රුපියල් | විභාග පරිපාලන කාර්ය සඳහා යෙදවූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බඳවා ගැනීමේ විභාග | 30 | 97669 | 48,509,496.00 | 5860 |
| සහතික පත්‍ර විභාග | 20 | 142936 | 10,032,419.00 | 8576 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 48 | 7946 | 1,525,104.00 | 529 |
| උසස් කිරීමේ විභාග | 13 | 12146 | 2,444,047.00 | 728 |
| විදේශ විභාග | 17 | 8186 | 729,643.00 | 820 |
| වෙනත් විභාග | 13 | 27527 | 2,189,539.00 | 1101 |
| **එකතුව** | **141** | **296410** | **65,430,248.00** | **17614** |

මූලාශ්‍රය - සංවිධාන හා විදේශ විභාග ශාඛාව

### 2.2 රහස්‍ය ශාඛාව (ආයතනික විභාග)

මෙම ශාඛාවෙහි වාර්ෂික වැඩ සැලැස්මට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, බැංකු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ නීති විද්‍යාල වැනි විවිධ ආයතන වෙනුවෙන් මාධ්‍ය තුනෙන් ම ප්‍රශ්න පත්‍ර සකස් කිරීම හා එම විභාග මධ්‍යස්ථාන වෙත බෙදා හැරීමත්, මීට අමතර ව විදේශ විභාග සඳහා විවිධ විදේශීය ආයතනවලින් ලැබෙන ප්‍රශ්නපත්‍ර විභාග මධ්‍යස්ථානවලට බෙදා හැරීමත් පිළිබඳ කාර්යයන් ඇතුළත් වේ.

| පවත්වන ලද විභාග වර්ගය | පවත්වන ලද විභාග සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | මාධ්‍ය අනුව සකස් කළ ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව | | | | මුද්‍රණය කළ ප්‍රශ්න පත්‍ර පිටපත් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | එකතුව |
| බඳවා ගැනීමේ විභාග | 34 | 244,179 | 77 | 72 | 66 | 215 | 231,100 | 22,800 | 11,700 | 265,600 |
| සහතික පත්‍ර විභාග | 24 | 129,863 | 210 | 84 | 91 | 384 | 132,200 | 26,450 | 9,700 | 162,350 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 38 | 11,673 | 152 | 116 | 60 | 328 | 14,150 | 4,215 | 2,900 | 21,265 |
| උසස් කිරීමේ විභාග | 14 | 12,914 | 84 | 66 | 54 | 204 | 19,500 | 7,800 | 5,950 | 33,250 |
| විදේශ විභාග | 15 | 42,815 | - | - | - | - | - | - | - | - |
| කැලණිය විශ්ව විද්‍යාලයේ විභාග | 02 | 25,600 | - | - | - | - | - | - | - | - |
| **එකතුව** | **127** | **467,044** | **523** | **338** | **271** | **1,132** | **396,950** | **61,265** | **30,250** | **482,465** |

මූලාශ්‍රය - රහස්‍ය ශාඛාව (ආයතනික විභාග)

### 2.3 ඇගයීම් ශාඛාව (ආයතනික විභාග)

ඉහත සඳහන් වෙනත් විභාගවල සියලුම ඇගයීම් කටයුතු මෙම ශාඛාව මගින් ඉටුකරනු ලැබේ. ඒ අනුව මෙම ශාඛාවේ 2012 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී වැඩ සැලැස්මට අනුව පහත සඳහන් විභාග පවත්වා ඇගයීම් කටයුතු අවසන් කර ඇත.

| විභාග වර්ගය | විභාග සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | ඇගයීම් සඳහා යෙදවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| බඳවා ගැනීමේ විභාග | 31 | 179,994 | 6000 |
| උසස් කිරීමේ විභාග | 11 | 21,050 | 900 |
| සහතික පත්‍ර විභාග | 20 | 97,278 | 2750 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 48 | 13,842 | 210 |
| වෙනත් විභාග (විදේශ විභාග ඇතුළුව) | 16 | 35,881 | 125 |
| **එකතුව** | **126** | **348,045** | **9985** |

මූලාශ්‍රය - ඇගයීම් ශාඛාව (ආයතනික විභාග)

### 2.4 ප්‍රතිඵල ශාඛාව (ආයතනික විභාග)

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සියලු ම ආයතනික විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමේ කටයුතු සිදුකරනු ලබන්නේ මෙම ශාඛාවයි.

මෙම ශාඛාවේ 2012.01.01 සිට 2012.12.31 දක්වා ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ සංඛ්‍යා ලේඛන

| විභාග වර්ගය | විභාග සංඛ්‍යාව | අපේක්ෂක සංඛ්‍යාව | ප්‍රතිඵල නිකුත් කළ විභාග සංඛ්‍යාව |
|---|---|---|---|
| බඳවා ගැනීමේ විභාග | 33 | 210,468 | 34 |
| උසස් කිරීමේ විභාග | 18 | 7,956 | 13 |
| සහතික පත්‍ර විභාග | 18 | 153,877 | 34 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 46 | 14,561 | 39 |
| වෙනත් විභාග | 04 | 31,860 | 09 |
| **එකතුව** | **118** | **418,722** | **129** |

මූලාශ්‍රය - ප්‍රතිඵල ශාඛාව (පාසල් නොවන)

## 03. පොදු සේවා කටයුතු

### 3.1 ආයතන ශාඛාව

දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය, ආයතන කටයුතු හා විනය කටයුතු පවත්වාගෙන යාම ආයතන ශාඛාවේ කාර්ය භාරය වේ. නිලධාරීන් හා සේවක කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, සේවයේ යෙදවීම්, මාරු කිරීම් හා විශ්‍රාම ගැන්වීම් ආදිය ඒ අතර ගැනේ. දෙපාර්තමේන්තුවේ ආරක්ෂක කටයුතු පවත්වාගෙන යාම ද, නඩත්තු හා සේවා සුපරීක්ෂණයට ලක් කිරීම ද පාලනය ද ආයතන ශාඛාවෙන් සිදුවන අනෙකුත් මෙහෙවර වේ.

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I, II, III | 73 | 57 | 16 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය | 04 | 03 | 01 |
| පරිපාලන නිලධාරි | 02 | 01 | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය I, II, III | 25 | 44 | - |
| මුද්‍රණාල අධිකාරි | 01 | - | 01 |
| භාෂා පරිවර්තක | 02 | 01 | 01 |
| අයවැය සහකාර | 01 | 01 | - |
| නේවාසිකාගාර පාලක | 01 | - | 01 |
| සහකාර නේවාසිකාගාර පාලක | 01 | 01 | - |
| ගොඩනැගිලි පරිපාලක | 01 | 01 | - |
| කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් | 248 | 196 | 52 |
| මුද්‍රණාලය | 49 | 45 | 18 |
| කාර්යාල කාර්ය සහායක | 125 | 87 | 12 |
| රියදුරු | 16 | 20 | - |
| දත්ත සටහන් ක්‍රියාකරු | * 37 | 15 | - |
| විභාග දත්ත සහකාර | * * 49 | 45 | 04 |
| දෙපාර්තමේන්තු ගත කණිෂ්ඨ සේවකයින් (ජලනල කාර්මික, ලොරි සහායක, අරක්කැමි ආදී) | 25 | 25 | - |
| එකතුව | 660 | 542 | 107 |

* ඇනට තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇත.

** බඳවා ගැනීම් සිදු කර නැත.

මූලාශ්‍රය - ආයතන ශාඛාව

## 3.2 තැපැල් ශාඛාව

විභාග කොමසාරිස් ජනරාල් නමින් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත නිලධාරීන් නමින් ලැබෙන සියලු ලිපි භාරගෙන, වර්ග කර, අදාළ ශාඛාවලට හා නිලධාරීන්ට යොමු කිරීම හා විභාග කොමසාරිස් ජනරාල් නමින් බැහැරට යැවෙන ලිපි ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවට භාරදීම හා දෙපාර්තමේන්තුව ප්‍රමුඛ කොට සිදුකරන සියලු ලිපිවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම මෙහි කාර්ය භාරය ලෙස සඳහන් කළ හැකිය.

| කාර්යයන් | සංඛ්‍යාව |
|---|---|
| ශාඛාවට ලැබී ඇති සාමාන්‍ය ලිපි සංඛ්‍යාව | 132,805 |
| ලියාපදිංචි තැපැලෙන් එවන ලද ලිපි සංඛ්‍යාව | 645,859 |
| මෙම ශාඛාවෙන් තැපැල් දෙපාර්තමේන්තුවට භාර දී ඇති සාමාන්‍ය ලිපි ප්‍රමාණය | 600,320 |
| සාමාන්‍ය ලිපි තැපැල් කිරීම සඳහා වැය වූ මුදල | රු. 7,480,019.00 |
| ලියාපදිංචි ලිපි ප්‍රමාණය | 16,720 |
| ලියාපදිංචි ලිපි තැපැල් කිරීම සඳහා වැය වූ මුදල | රු. 901,935.00 |

මූලාශ්‍රය - තැපැල් ශාඛාව

## 3.3.1 මුදල් ශාඛාව

දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන නොයෙකුත් විභාග සංවිධානය, පරිපාලනය, ඇගයුම් හා ප්‍රතිඵල නිකුත් කිරීමේ මෙහෙයුම් කාර්යයන්ට, ප්‍රතිඵල සනාථ කිරීමට හා සහතික නිකුත් කිරීමට අදාළ ආදායම් හා වියදම් කළමනාකරණය කිරීම මෙම ශාඛාව මගින් සිදුවේ. මීට අමතරව දෙපාර්තමේන්තුවට අදාළ සියලුම ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් හා මූලධන වත්කම් අත්පත් කර ගැනීමට අදාළ මූල්‍යමය කටයුතු ද මෙම ශාඛාව මගින් සිදු කෙරේ.

දෙපාර්තමේන්තුවේ ආදායම් මාර්ග වන්නේ, සහතිකපත් නිකුත් කිරීමේදී, දෙවරකට වැඩි වාර ගණනක් පෙනී සිටීමේදී, නැවත සමීක්ෂණවලදී හා සංවිධාන හා විදේශ විභාග ශාඛාව මගින් පවත්වන ඇතැම් විභාග සඳහා පෙනී සිටීමේදී අයදුම්කරුවන්ගෙන් අය කරන ගාස්තු ය.

2012 වර්ෂයට අදාළ ව මූල්‍ය තොරතුරු පහත දැක්වෙන අයුරින් සම්පිණ්ඩනය කළ හැකිය.

## 2012 - මූල්‍ය කාර්යඵල වාර්තාව

| වැය ශීර්ෂගත වියදම් | වාර්ෂික ප්‍රතිපාදනය (රු.) | 2012 දෙසැ. 31 දිනට වියදම (රු.) |
|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 166,725,000.00 | 183,546,546.43 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 1,580,315,000.00 | 1,560,123,003.55 |
| අතිරේක ප්‍රතිපාදන | 20,000,000.00 | |
| මුළු පුනරාවර්තන වියදම් | **1,767,040,000.00** | **1,743,669,549.98** |
| **මූලධන වියදම්** | | |
| **පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම** | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,350,000.00 | 1,328,859.28 |
| යන්ත්‍ර හා උපකරණ | 3,800,000.00 | 1,914,033.09 |
| වාහන | 3,100,000.00 | 2,627,327.53 |
| **එකතුව** | **8,250,000.00** | **5,870,219.90** |
| | | |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,100,000.00 | 1,074,816.76 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,600,000.00 | 1,594,730.96 |
| **එකතුව** | **2,700,000.00** | **2,669,547.72** |
| | | |
| **වෙනත් මූලධන** | | |
| දැනුම පදනම් කරගත් ආර්ථිකයක් සඳහා මානව ප්‍රාග්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය-ලෝක බැංකුව) | 10,000,000.00 | |
| **එකතුව** | **10,000,000.00** | |
| **මුළු මූලධන එකතුව** | **20,950,000.00** | **8,539,767.62** |
| වාර්ෂික ආදායම | ඇස්තමේන්තුව | තථ්‍ය ආදායම (රු.) |
| විකුණුම් හා ගාස්තු - විභාග ආදායම් | 150,000,000.00 | 263,015,515.87 |
| **රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම** | සීමාව (රු.) | 2012.12.31 දිනට තථ්‍ය (රු.) |
| උපරිම හර සීමාව | 18,000,000.00 | 12,499,194.72 |
| අවම බැර සීමාව | 13,000,000.00 | 17,659,185.94 |
| උපරිම හර ශේෂ සීමාව | 115,000,000.00 | 70,954,075.74 |

මූලාශ්‍රය - මුදල් ශාඛාව

### 3.3.2 සැපයීම් ශාඛාව

සියලු ම විභාග සඳහා අවශ්‍ය පුනරාවර්තන භාණ්ඩ මිලදී ගැනීම හා බෙදා හැරීමත්, මූල ධන වත්කම් මිල දී ගැනීම හා නඩත්තු කිරීමත් මෙම ශාඛාවෙන් ඉටුවේ.

ප්‍රධාන වශයෙන් 2012 වර්ෂය තුළ පවත්වන ලද අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) සහ 5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග සමඟ වෙනත් ආයතනික විභාග, බඳවා ගැනීමේ විභාග රාශියක් සඳහා කිසිදු ප්‍රමාදයකින් තොරව සියලු ම ලිපි ද්‍රව්‍ය බෙදා හැරීම සිදු කරන ලදී. මේ යටතේ උක්ත විභාගවලට අවශ්‍ය උත්තර ලියන පොත්, කඩදාසි, O.M.R. කඩදාසි, ලිපි කවර, නූල්, ගම් ආදී සියලු ම ලිපිද්‍රව්‍ය සැපයීම් සඳහා ලියාපදිංචි ආයතනවලින් මිල ගණන් කැඳවා තාක්ෂණ ඇගයීම් මණ්ඩල නිර්දේශ පරිදි භාණ්ඩ ලබා ගැනීම සිදු කර ඇත.

පසුගිය වර්ෂවල විනාශ කළ යුතු උත්තර පත්‍ර, ප්‍රශ්න පත්‍ර සහ අනෙකුත් ඉවතලන රහස්‍ය කඩදාසි වාලච්චේන කඩදාසි කම්හල වෙත ප්‍රතිචක්‍රීයකරණය සඳහා භාර දී ඇත.

දෙපාර්තමේන්තුව සතු සියලු ම වාහන නඩත්තු කිරීම, රාජකාරිමය අවශ්‍යතා සඳහා වාහන ලබාදීම සිදුකර ඇත.

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මගින් අපහරණය කිරීම සඳහා අපහරණ මණ්ඩලයේ අනුමැතිය පරිදි ගබඩාව වෙත භාර දෙන ලද භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවා වැඩිම මිල ඉදිරිපත් කර ඇති ගැනුම්කරුට විකුණා අදාළ වටිනාකම් රජයේ ආදායමට බැර කර ඇත.

දෙපාර්තමේන්තුව සතුව එක් එක් ශාඛාව යටතේ ඇති ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර ආදී සියලු ම යන්ත්‍රවල අළුත්වැඩියා සිදු කිරීම හා නඩත්තු කිරීමට අදාළ කටයුතු ඉටුකර ඇත.

මූලාශ්‍රය - සැපයීම් ශාඛාව

### 3.4 මුද්‍රණාලය (රහස්‍ය හා රහස්‍ය නොවන)

ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව මගින් ඉටු කරන විභාග පැවැත්වීමේ, ඇගයීමේ හා ප්‍රතිඵල සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී ඉතාමත් සුවිශේෂ වූ කටයුතු රාශියක් මුද්‍රණාලය මගින් මෙම කාල වකවානුව තුළ සිදු කරන ලදී.

ඊට අදාළ සංක්ෂිප්ත වාර්තාවක් පහත දැක්වේ.

**2012.01.01 දින සිට 2012.12.31 දින දක්වා කාලය තුළ මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර හා වෙනත් විභාග ලිපි ලේඛන**

| | සංඛ්‍යාව |
|---|---|
| 2012 අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මාධ්‍ය තුනෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර (නව/පැරණි) | 3,124,850 |
| පොත් වශයෙන් මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර (විෂයයන් 4ක් සඳහා) | 1,874,550 |
| 2012 අ.පො.ස. (උ.පෙළ) භූගෝල විද්‍යාව විෂයය සඳහා වෙන් වෙන්ව මුද්‍රණය කරන ලද වර්ණ සිතියම් සහ කළු සුදු සිතියම් (නව/පැරණි) | 101,900 |
| 2012 වර්ෂයේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා මාධ්‍ය දෙකෙන්ම මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර | 674,000 |
| 2012 අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා මාධ්‍ය තුනෙන්ම මුද්‍රණය කරන ලද ප්‍රශ්න පත්‍ර | 7,204,400 |
| 2012 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ භූගෝල විද්‍යාව විෂයය සඳහා මුද්‍රණය කරන ලද වර්ණ සිතියම් | 127,000 |
| මෙම විභාගයට අදාළ ව වර්ණ චිත්‍ර සහිතව මුද්‍රණය කළ ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව | 283,200 |
| චිත්‍ර කලාව විෂයය සඳහා වර්ණ චිත්‍ර සහිත ප්‍රශ්න පත්‍ර | 156,200 |

**මුද්‍රණය කරන ලද වෙනත් ලිපි ලේඛන (රහස්‍ය නොවන)**

| | සංඛ්‍යාව |
|---|---|
| 1. විභාගවලට අවශ්‍ය ජර්නල් පොත් සහ උපදෙස් පොත් | 165,023 |
| 2. විවිධ විභාග සඳහා සහතික | 92,972 |
| 3. විවිධ ලේබල් | 3,393,850 |
| 4. විවිධ පෝර්ම | 3,608,500 |
| 5. විවිධ ලිපි ශීර්ෂ | 250 |
| 6. කවර මුද්‍රණය | 639,160 |
| 7. ගොනු කවර මුද්‍රණය | 8,250 |
| 8. සහතික පත්‍ර ශාඛාව වෙනුවෙන් මුද්‍රණය කරන ලද සහතික පත්‍ර | 51,850 |
| 9. ප්‍රතිඵල ලේඛන/ ප්‍රතිඵල සටහන් මුද්‍රණය | 302,130 |
| 10. වෙනත් විවිධ මුද්‍රණ | 2,175,320 |

## වෙනත් විවිධ මුද්‍රණ

* පිටකවර
* VISITING CARD
* සිංහල/දෙමළ අත් පත්‍රිකා
* හැඳුනුම්පත්
* ප්‍රස්තාර කඩදාසි
* M.C.Q. අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ)
* චිත්‍ර කඩදාසිය දෙපැත්ත
* විභාග මධ්‍යස්ථාන දැන්වීම්
* විභාග කාල සටහන් (අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) සහ 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය)
* එක් දින සේවා හා සාමාන්‍ය සේවා කාඩ් පත්
* අවසර පත්‍ර කාඩ්
* VISITOR'S PASS
* OMR පිළිතුරු පත්‍ර ඇගයීම් පත්
* CAR PASS

මූලාශ්‍රය - මුද්‍රණාලය

## 3.5 පරිගණක ශාඛාව

දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු ම විභාගවල දත්ත/ලකුණු ඇතුළත් කිරීම්, සංස්කරණය හා ප්‍රායෝගික භාවිතයට සුදුසු වන පරිදි හැසිරවීම, ඒ ආශ්‍රිතව ප්‍රවේශ පත්‍ර, පැමිණීමේ ලේඛන, ප්‍රතිඵල ලේඛන හා සහතික පත්‍ර මුද්‍රණය මෙම ශාඛාවේ ප්‍රධාන කාර්ය භාරය වේ. විභාග ආශ්‍රිත දත්ත ගබඩාකරණය හා ඒවා සුරක්ෂිතව තබා ගැනීම ද මෙම ශාඛාවෙන් ඉටුවන තවත් වැදගත් කාර්යයකි. අධ්‍යාපනික සංවර්ධන ක්‍රියාවලිය සඳහා පාසල්, කලාප, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ සාධන තත්ත්වය පිළිබඳ දත්ත, පර්යේෂණ හා සංවර්ධන ශාඛාවට අවශ්‍ය වන පරිදි ලබාදීමත් වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලින් ඵලදායී කාර්යයන් සඳහා කරනු ලබන ඉල්ලීම් මත තොරතුරු වාර්තා හා විශ්ලේෂණ ලබාදීමත් මෙම ශාඛාවෙන් ඉටු කරනු ලබයි. සියලු ම විභාග සම්බන්ධයෙන් පරිගණක වැඩසටහන් සකස් කිරීම, මෙහෙයවීම හා සුරක්ෂණය ද මෙගින් සිදුවේ.

මූලාශ්‍රය - පරිගණක ශාඛාව

## 3.6 දත්ත සටහන් ශාඛාව

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් පරිගණක ගත කර පවත්වනු ලබන සියලු ම විභාග හා සම්බන්ධ දත්ත හා ඒවායේ සංශෝධන සටහන් කිරීම හා එම විභාග සඳහා පෙනී සිටි අපේක්ෂකයින්ගේ ලකුණු සටහන් කිරීම මෙම ශාඛාවේ කාර්යභාරය වේ. මෙහිදී පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල පාසල් විභාග ඇගයීම්, සංවිධාන හා විදේශ විභාග සහ ප්‍රතිඵල (ආයතනික විභාග) යන ශාඛා මගින් අදාළ තොරතුරු මෙම ශාඛාව වෙත සපයනු ලැබේ.

ඉහත සඳහන් ශාඛා මගින් 2012 වසරේ සිදු කරන ලද සියලු ම පරිගණකගත විභාගවලට අදාළ කටයුතු නියමිත කාලසීමාව ඇතුළත සාර්ථකව නිමකර ඇත.

මූලාශ්‍රය - දත්ත සටහන් ශාඛාව

### 3.7 සැලසුම් හා නියාමන ශාඛාව

**01. විභාග දෙපාර්තමේන්තුවේ භෞතික සම්පත් අවශ්‍යතා ගණනය කර වාර්තාවක් සකස් කිරීම**

- ශාඛා ප්‍රධානීන් රැස්කරවා භෞතික සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීම.
- එම අවශ්‍යතා පළමුවන අදියර හා දෙවන අදියර වශයෙන් අවශ්‍යතා පෙළ ගැසීම.
- ලැප්ටොප්, මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර්, මුද්‍රණ යන්ත්‍ර ආදිය ලබා ගැනීමට පිරිවිතර සකස් කර සැපයීම් ශාඛාව වෙත ඉදිරිපත් කිරීම.

**02. නව බහු කාර්ය ගොඩනැගිල්ල සකස් කිරීම**

- නව ගොඩනැගිල්ල සකස් කිරීමට අවශ්‍ය සඳහා උපදේශන සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ඉන්ජිනේරු සංස්ථාව සමඟ අවශ්‍ය කටයුතු සම්පාදනය
- එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යෝජිත භූමියේ මිණුම් කටයුතු සඳහා Survey Engineering Company Ltd ආයතනයට බාරදී ඉටු කරවා ගැනීම.

**03. පරිගණක වැඩසටහන් නිර්මාණය හා වැඩි දියුණු කිරීම.**

- කොළඹ හා මොරටුව විශ්ව විද්‍යාල දෙකෙහිම පරිගණක අංශයේ විශේෂඥයින් සමඟ සාකච්ඡා කර උපදේශන සේවා ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු යෙදීම.

**04. විභාග කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම හා පරිගණක වැඩසටහන් සම්පාදනය කිරීම.**

- විභාග පරිපාලන කාර්ය මණ්ඩල පුහුණු සංචිතයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටු කිරීම. (පුවත්පත් දැන්වීම /ඉල්ලුම් පත්‍ර සැලසුම් කිරීම ආදී)
- පුහුණු සංචිතය මෙහෙයවීම සඳහා අවශ්‍ය මෘදුකාංග සකස් කිරීමට අවශ්‍ය කටයුතු යෙදීම.
- පුහුණු මොඩියුල සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- ඒ සඳහා නේවාසික වැඩමුළුවක් සංවිධානය කිරීම.

**05. 2013 වර්ෂය සඳහා ක්‍රියාකරී සැලැස්ම සකස් කිරීම.**

- 2013 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලසුම් සෑම ශාඛාවකින්ම ලබා ගැනීම.
- සෑම ශාඛාවකින්ම ලැබුණු ක්‍රියාකාරී සැලසුම් ඇසුරෙන් දෙපාර්තමේන්තුවේ සමස්ත වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

**06. නව ශාඛාව ස්ථාපිත කිරීම හා අවශ්‍ය උපකරණ ලබා ගැනීම.**

මූලාශ්‍රය - සැලසුම් හා නියාමන ශාඛාව